

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயற்றிறன் அறிக்கை

Annual Performance Report

2024

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

கருத்திட்ட முகாமைத்துவம் மற்றும் கண்காணிப்புத் திணைக்களம்

Department of Project Management and Monitoring

වැය ශීර්ෂ අංක : **280**

செலவினத் தலைப்பு இலக்கம் 280

Expenditure Head No: 280

මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

Ministry of Finance, Planning and Economic Development

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංක 280

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

03 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශකය

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

06 පරිච්ඡේදය- මානව සම්පත් පැතිකඩ

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

සම්පත් කාර්යක්ෂමව සහ ප්‍රශස්තව රාජ්‍ය ආයෝජනයෙහි යෙදවීම සහතික කරනු වස් රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේදී දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වලින් අපේක්ෂිත ප්‍රතිඵල එකඟවූ පිරිවැය හා කාලරාමුව තුළ සාක්ෂාත් කර ගැනීම සඳහා සුවිශේෂ අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍යවේ. තවද, මනා කළමනාකරණ හා අධීක්ෂණ ක්‍රියාවලියක් තුලින් ව්‍යාපෘති හා වැඩසටහන්වල ප්‍රගතිය අදාළ පාර්ශවයන් වෙත වාර්තා කිරීම මෙන්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන අවහිරතා සහ ගැටළු නිරාකරණය කිරීම සම්බන්ධයෙන් නිසිකල්හි තාර්කික හා දැනුවත් තීරණ ගැනීමටද හැකිවේ. මෙම මුඛ්‍ය අරමුණ ඉටුකර ගැනීම පිණිස ව්‍යාපෘති සුමටව සහ නියමිත කාලරාමුවක් තුල ක්‍රියාත්මක කිරීමට අදාළ අධීක්ෂණය, උපදේශනය හා පහසුකම් සැලසීම ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබයි.

එමෙන්ම, රටෙහි සංවර්ධනය සහ තිරසාර පැවැත්මක් සඳහා යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීමට හැකිවන පරිදි ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුව රාජ්‍ය අංශය තුල ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම මෙන්ම විවිධ පාර්ශවයන් විසින් සිදුකරණු ලබන ඉල්ලීම් මත පදනම්ව ව්‍යාපෘති ඇගයීම් සිදුකිරීම හා ඒ තුළින් සැලසුම් ක්‍රියාවලිය සඳහා නිර්දේශ ලබාදීමද ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබයි. ව්‍යාපෘති ඇගයීම් තුලින් සංවර්ධන වැඩසටහන්වල සැලසුම්කරණය, මූල්‍යනය, අධීක්ෂණය සහ කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා වැඩදායී යෙදවුම් සැපයේ. එබැවින් සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වල කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම උදෙසා අතීත අත්දැකීම් වලින් උගත් පාඩම් උකහා ගැනීම පිණිසත්, අතීතයේදී සිදුවූ දෝෂද මගහරවා ගනිමින් අනාගත ව්‍යාපෘති විධිමත්ව සැලසුම්කිරීම උදෙසා සාක්ෂිමත පදනම්වූ ඇගයීම් විශ්ලේෂණයන් තීරණාත්මක අංගයක් වනු ඇත.

1.2 ආයතනයේ දැක්ම මෙහෙවර සහ අරමුණු

දැක්ම

සංවර්ධනයේ සඵලදායීතාව කරා

මෙහෙවර

අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය සහතික කරනුවස් සියලුම සංවර්ධන ව්‍යාපෘතීන් අධීක්ෂණය, ඇගයීම සහ පහසුකම් සැලසීම මෙන්ම ක්‍රියාත්මක කරනු ලබන ආයතන වෙත උපදේශනය ලබාදීම.

අරමුණු

සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතා කිරීම තුළින් එකඟ වූ කාලරාමුව සහ පිරිවැය තුළ අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය ඉහළ නැංවීම.

1.3 ප්‍රධාන කාර්යයන්

1. දේශීය සහ විදේශීය මූල්‍යයනය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්හි තොරතුරු එක් රැස් කිරීම, විශ්ලේෂණය හා අධීක්ෂණය.
2. විශාල සහ මහා පරිමාණයේ ව්‍යාපෘති හා වැඩසටහන්හි කාර්යසාධනය කාර්තුමය වශයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කිරීම.
3. ජාතික මෙහෙයුම් මැදිරිය හරහා මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් වල ගැටළු නිරාකරණය

4. විදේශ මූල්‍යයනය යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සහ වැඩසටහන්හි ප්‍රගතිය සමාලෝචනය සඳහා සංවර්ධන පාර්ශවකරුවන් වෙත පහසුකම් සැලසීම.
5. තෝරාගත් විදේශ මූල්‍යයනය සහිත ව්‍යාපෘතින්හි ප්‍රතිඵල අත්පත් කරගැනීමේ ප්‍රගතිය සත්‍යාපනය කිරීම හා මූල්‍ය ආධාර සපයනු ලබන ආයතනවලට එම ණය වාරික නිදහස්කල හැකිවන පරිදි ව්‍යාපෘතිවල ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහතික කිරීම.
6. ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම.
7. විවිධ පාර්ශවයන් විසින් කරනු ලබන ඉල්ලීම් මත පදනම්ව ව්‍යාපෘති ඇගයීම් සිදුකිරීම හා ඒ තුළින් සැලසුම් ක්‍රියාවලිය සඳහා නිර්දේශ ලබාදීම.
8. සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්වල කාර්ය සාධන වාර්තා ප්‍රකාශයට පත්කිරීම තුළින් සංවර්ධන තොරතුරු බෙදා හැරීම.

1.4 සංවිධාන සටහන (ඇමුණුම - 1)

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

තාක්ෂණික අංශ 07 ක් සහ සහාය අංශ 02 කින් සමන්විත ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ ජනරාල් සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් පස් දෙනෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ පහත පරිදි ව්‍යුහගත වී ඇත.

තාක්ෂණික අංශ

i. කර්මාන්ත හා මූල්‍ය
ii. ජල සම්පාදන හා විදුලිබල
iii. කෘෂිකර්ම හා වාරිමාර්ග
iv. අධ්‍යාපන හා සෞඛ්‍ය
v. නාගරික පළාත් හා ප්‍රාදේශීය සංවර්ධන
vi. ප්‍රවාහන හා මහාමාර්ග
vii. රාජ්‍ය පරිපාලනය

සහාය අංශ

i. ආයතනික
ii. මුදල්

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් අධීක්ෂණය හා වාර්තා කිරීම.

2024 අංක 44 දරණ (PFMA) පොදු මූල්‍ය කළමනාකරණ පනතේ නියමයන් අනුව, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව (DPMM) විදේශීය හා දේශීය අරමුදල් ආධාරයෙන් ක්‍රියාත්මක වන සියලු මහා පරිමාණ ව්‍යාපෘති මාසිකව අධීක්ෂණය කිරීම කළ යුතු අතර මෙහි අරමුණ වන්නේ සියලුම පොදු ආයෝජන නියමිත කාලය තුළ අනුමත අයවැය ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් හණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීම හා නිම කිරීමයි. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දැනගනීම සඳහා සහ මාර්ගෝපදේශ/ ප්‍රතිපත්තිමය තීරණ ලබා ගැනීමට ව්‍යාපෘති ප්‍රගති වාර්තා කාර්තුමය වශයෙන් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ.

ඒ අනුව, PFMA හි නියමයන්ට අනුව, ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන / ව්‍යාපෘති කළමනාකරණ ඒකක / ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අධීක්ෂණයට සහ වාර්තාකරණය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සහ වාර්තා ආකෘති නිකුත් කිරීම DPMM වෙත පැවරී ඇත.

විදේශීය මූල්‍ය ආයතන මඟින්, ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගතකරණය අවසන්වන තුරු ණය/ ආධාර මුදල් වාරික නිකුත් කිරීම තාවකාලිකව නතර කර තිබූ හෙයින් ව්‍යාපෘති මූල්‍ය කළමනාකරණය අභියෝගාත්මක තත්වයක පවතින අවධියක ඒකාබද්ධ අරමුදලින් මෙන්ම රාජ්‍ය ආයතනයන්හි ඉපැයුම් තුළින්ද ආයෝජනයකර ඇති අරමුදල් සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන්හි ඵලදායීව උපයෝජනය කරමින් හා උපායමාර්ගික ප්‍රවේශයක් අනුගමනය කරමින් අපේක්ෂිත ප්‍රතිලාභ ජනතාවට කාලීනව ලබාදීමට හැකිවන පරිදි සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය 2024 වර්ෂයේදී ද, දෙපාර්තමේන්තුවට අභියෝගාත්මක විය. එම අභියෝග මධ්‍යයේ වුවද දෙපාර්තමේන්තුව විසින් 2023 වසරේ සිව්වන කාර්තුවේ ප්‍රගති වාර්තාව සහ 2024 වර්ෂයට නියමිත ප්‍රගති අධීක්ෂණ කටයුතු සිදුකර ඒ සම්බන්ධ නිරීක්ෂණ ඇතුලත් දෙවන හා තෙවන කාර්තුවලට අදාළ කාර්තුමය ප්‍රගති වාර්තා හා අනෙකුත් වාර්තා සම්පිණ්ඩනය කර නිර්දේශයන්ද සමඟ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට මෙම දෙපාර්තමේන්තුව සමත් විය. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මාසිකව සහ කාර්තුමය වශයෙන් අධීක්ෂණය කරන ලදි. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ තත්වය / කාර්ය සාධනය අනුව වර්ණ කේත (color codes) මත පදනම්ව වර්ගීකරණය කරන ලදී. මෙහිදී, කාල කළමනාකරණය, වියදම් කළමනාකරණය, සහ අවදානම් / ගැටළු කළමනාකරණ මට්ටම සැලකිල්ලට ගන්නා ලදී.

2024 වර්ෂයේ දේශීය හා විදේශීය මූල්‍යයනය මත විවිධ රේඛීය අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වූ විශාල සහ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව 226 කි. එම අමාත්‍යාංශ වෙතින් මාසිකව ව්‍යාපෘතිවල ප්‍රගති දත්ත ලබා ගැනීම සිදුකරන ලදි. මෙම විශාල සහ මහා පරිමාණ ව්‍යාපෘති අතරින්, 120 ක් දේශීය අරමුදල් හා ණය මගින් සහ ව්‍යාපෘති 106 ක් විදේශීය ණය හා ප්‍රදාන මගින් මූල්‍යනය කර ඇත.

2024 වර්ෂය තුළ පැවති විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය, ආනයන සීමාවන්, අමුද්‍රව්‍ය මිල ඉහළ යාම, සංවර්ධන පාර්ශවකරුවන් ණය වාරික නිදහස් කිරීම අත්හිටුවීම යනාදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බලපෑ විවිධ සීමාවන් මධ්‍යයේ වුවද, 2024 සිව්වන කාර්තුව අවසන් වන විට නිමකිරීමට නියමිතව තිබූ ව්‍යාපෘති 110 ක් අතුරින් ව්‍යාපෘති 23 ක් පමණක් අවසන් ව්‍යාපෘති ප්‍රතිඵලය ජනනය කිරීමට සමත්ව තිබිණි. තවද, කාර්ය සාධන ගැටළු හේතුවෙන් මහා පරිමාණ ව්‍යාපෘති 02ක් වර්ෂ අවසානය වන විට අත්හිටවූ බවට වාර්තා විය.

වගුව 2.1 : මූල්‍යනය අනුව මහා පරිමාණ ව්‍යාපෘති වර්ගීකරණය හා ප්‍රගතිය					
මූල්‍යන මූලාශ්‍රය	ව්‍යාපෘති ගණන	2024 ප්‍රතිපාදන (රු.බි.)	සත්‍ය වියදම (රු.බි.)	මූල්‍ය ප්‍රගතිය (%)	අතැති බිල්පත් (රු.බි.)
දේශීය අරමුදල්	116	183.40	107.25	58.4	3.03
දේශීය ණය	4	6.00	2.50	41.6	0.19
විදේශීය ණය	82	478.08	278.56	58.2	26.10
විදේශීය ප්‍රදාන	24	37.94	13.65	35.9	0.00
එකතුව	**226**	**705.42**	**401.96**	**56.9**	**29.32**

සමස්ථ වර්ෂය පුරාම සිදුකරණු ලබන ප්‍රගති සමාලෝචන ක්‍රියාවලියේදී හඳුනාගත් සමහර ව්‍යාපෘතීන්හි පවත්නා ගැටළු විසඳීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුව ඇත. එම නිසා ව්‍යාපෘතීන්හි සත්‍ය තත්ත්වය අනාවරණය කර ගැනීම පිණිස රේඛීය අමාත්‍යාංශ මඟින් ලබාදෙන මාසික හා කාර්තුමය වාර්තා සහ පාර්ශවකරුවන් සමඟ පවත්වන ව්‍යාපෘති කාර්යසාධන රැස්වීම් පමණක් ප්‍රමාණවත් නොවන අතර, ඇතැම් ව්‍යාපෘතීන්හි පවත්නා ගැටළු විසඳීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ක්ෂේත්‍ර චාරිකා වල නිරත වීම තුළින් ලබා ගන්නා නිරීක්ෂණ බෙහෙවින් වැදගත්වේ.

2024 වසරේදී, මෙම දෙපාර්තමේන්තුව විසින් රේඛීය අමාත්‍යාංශ නිලධාරීන් සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම් මාලාවක් පැවැත්විනි. මෙහි ප්‍රධාන අරමුණ වූයේ, කාර්තුමය ප්‍රගති වාර්තා සමාලෝචනය කිරීමෙන් හඳුනාගනු ලැබූ දැඩි අවධානයක් යොමුවියයුතු වඩාත් අභියෝගාත්මක විශාල සහ මහා පරිමාණ ව්‍යාපෘති සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සහ පවතින ගැටළු විසඳා ඒවා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීමයි.

මීට අමතරව, දෙපාර්තමේන්තු මට්ටමින් විසඳිය නොහැකි ගැටළු සඳහා විසඳුම් ලබාදීම සඳහා ජාතික මෙහෙයුම් මැදිරිය හරහා අවශ්‍ය පහසුකම් සැපයීමට මෙම දෙපාර්තමේන්තුව කටයුතු යොදන ලදි.

2.2 ක්ෂේත්‍ර අධීක්ෂණ

මෙම දෙපාර්තමේන්තුව විසින් සෑම වර්ෂ ආරම්භයකදීම එකිනෙක අංශයන් යටතේ ක්ෂේත්‍ර චාරිකා සැලැස්ම පිළියෙල කරනු ලබයි. 2024 දීද වසරේ ප්‍රාග්ධන අරමුදල් ප්‍රවාහ ජනතා මූලික අවශ්‍යතා සපුරාලීම අරමුණු කරගනිමින් පුනරාවර්තන වියදම් වෙනුවෙන් යෙදවීමට සිදුවීම මෙන්ම රටෙහි පැවති ආර්ථික උද්ධමනය හේතුවෙන් ඉන්ධන මිළ සීඝ්‍රයෙන් වැඩිවීම නිසා ඇතිවූ ප්‍රවාහන පිරිවැය ඉහලයාමෙන් ඇතිවූ අවහිරතා මධ්‍යයේ වුවද එම වර්ෂයට ඉලක්ක කරගත් ක්ෂේත්‍ර චාරිකා 79 අතරින් සියලුම අංශ ආවරණය වන පරිදි තීරණාත්මක ව්‍යාපෘති 41 ක්, නිරීක්ෂණය කරන ලද අතර එම ක්ෂේත්‍ර නිරීක්ෂණ, වාර්තා හා දත්ත අනුව සංවර්ධන ව්‍යාපෘති වල ගැටළු නිරාකරණය සඳහා දෙපාර්තමේන්තුව විසින් විශේෂ කාර්ය භාරයක් සිදු කරන ලදී.

වගුව 2.2 : ප්‍රගතිය ක්ෂේත්‍ර චාරිකා මගින් අධීක්ෂණය
(2024.01.01 සිට 2024.12.31 දින දක්වා)

අංශය/ ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර අධීක්ෂණය සඳහා සැලසුම් කළ ව්‍යාපෘති සංඛ්‍යාව	ක්ෂේත්‍ර අධීක්ෂණය සිදු කළ ව්‍යාපෘති සංඛ්‍යාව	අදාල ආයතන වෙත යොමුකරන ලද අධීක්ෂණ වාර්තා සංඛ්‍යාව
ජලසම්පාදන/ විදුලි බල	08	4	4
කෘෂිකර්ම හා වාරිමාර්ග	21	08	08
අධ්‍යාපන/ සෞඛ්‍ය/ තරුණ හා ක්‍රීඩා	16	11	11
ප්‍රවාහන/ මහාමාර්ග/ වරාය හා නාවික	13	08	08
ප්‍රාදේශීය, පළාත් සංවර්ධන හා රාජ්‍ය පරිපාලනය	05	03	03
නාගරික සංවර්ධන/ ඉදිකිරීම් හා නිවාස	05	04	04
ආරක්ෂක/ මහජන ආරක්ෂක/ කර්මාන්ත/ ආයෝජන ප්‍රවර්ධන	11	03	03
මුළු එකතුව	**79**	**41**	**41**

1. ජල සම්පාදන හා විදුලිබල

අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීමේ සහ බලශක්තිය සුරැකීමේ ව්‍යාපෘතිය




යාපනය- කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය




ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය




2. අධ්‍යාපන/ සෞඛ්‍ය/ තරුණ හා ක්‍රීඩා

විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

ඉංජිනේරු පීඨ ගොඩනැගිල්ල - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය





බහුකාර්ය ගොඩනැගිලි සංකීර්ණය - කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍ය පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය





තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන,

තාක්ෂණ පීඨ ගොඩනැගිල්ල ධර්මපාල විද්‍යාලය පන්නිපිටිය



ඉදිකිරීම්



ගෘහභාණ්ඩ සැපයීම


3. ප්‍රවාහන/ මහාමාර්ග/ වරාය හා නාවික

දුම්රිය සංවර්ධන ව්‍යාපෘතිය - මහව සිට ඕමන්ත දක්වා දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීම






කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය- දුම්රිය මාර්ග කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - දුම්රිය විදුලි සංඥේශ පද්ධතියක් ස්ථාපිත කිරීම




පිදුරුතලාගල ද්විතීයික නිරීක්ෂණ රේඩාර් පද්ධතිය ස්ථාපිත කිරීම





4. ප්‍රාදේශීය, පළාත් සංවර්ධන හා රාජ්‍ය පරිපාලනය

ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය
අනුරාධපුර



ළමා සුරැකුම් මධ්‍යස්ථානය



තලාව ප්‍රාදේශීය සභා පෙරපාසැල



ගල්නෑව සතිපොළ



අස්වනු නෙලීමේ පහසුකම සහිත ට්‍රැක්ටරය

මහ කොලඹ අප ජල කළමනාකරණ ව්‍යාපෘතිය



තිඹිරිගස්යාය පොම්පාගාරය



බම්බලපිටිය පොම්පාගාරය

2.3 විශේෂ රැස්වීම් සහ සාකච්ඡා පැවැත්වීම

රේඛීය අමාත්‍යාංශ නිලධාරීන්, ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන්, කොන්ත්‍රාත්කරුවන්, සංවර්ධන පාර්ශවකරුවන් සහ මුදල් අමාත්‍යාංශයේ අනෙකුත් දෙපාර්තමේන්තුවල නියෝජිතයින්ගේද සහභාගීත්වයෙන්, නව මූල්‍ය ප්‍රභවයන්, ව්‍යුහාත්මක කරුණු, සවිස්තරාත්මක සංවර්ධන විකල්ප යෝජනා සහ නව ව්‍යාපෘති ප්‍රවේශයන් හි පවතින ව්‍යාපෘති ගැටළු සමාලෝචනය කිරීම සඳහා මෙන්ම ව්‍යාපෘති කඩිනම් කිරීම තුළින් රාජ්‍ය ආයෝජනයන්හි අපේක්ෂිත ප්‍රතිඵල කාලීනව ජනනය වූ බවට තහවුරු කර ගැනීමේ ද අරමුණු ඇතිව දෙපාර්තමේන්තුව විසින් විශේෂ රැස්වීම් සහ සාකච්ඡා පවත්වනු ලබයි. තවද, මෙම දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කල විශේෂ රැස්වීම් මාලාවක් පවත්වන ලද අතර ප්‍රවාහන අපහසුතාවයන් හේතුවෙන් රැස්වීම් සඳහා සහභාගීත්වය ගැටළු සහගතවූ අවස්ථාවන්හි අදාල පාර්ශවයන් මාර්ගගත ක්‍රමය ඔස්සේද සහභාගී කරවා ගනු ලැබිණි.

සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමේ මූලික කටයුතු, ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීම්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීම සහ අන්තර්-ආයතන ගැටලු විසඳීම යනාදී කටයුතු විධිමත් කිරීමට සහ කාර්යක්ෂමව සිදු කිරීමට අවශ්‍ය අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම තුළින් අඛණ්ඩව පහසුකම් සැපයීම පිණිස, මෙම දෙපාර්තමේන්තුව මගින් විශේෂ සාකච්ඡා සහ රැස්වීම් පවත්වනු ලබන අතර, අනෙක් ආයතන මගින් පවත්වනු ලබන සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධ රැස්වීම්, සාකච්ඡා සඳහා ද දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී විය.

වගුව 2.3 : සාකච්ඡා සහ විශේෂ රැස්වීම් පැවැත්වීමේ ප්‍රගතිය
(2024.01.01 සිට 2024.12.31 දින දක්වා)

රැස්වීම් / සාකච්ඡා වර්ගීකරණය	සංඛ්‍යාව
ව්‍යාපෘති ගැටළු පිළිබඳව රේඛීය අමාත්‍යාංශ, ව්‍යාපෘති කළමනාකරණ ඒකක හා මෙම දෙපාර්තමේන්තුව සමඟ පැවති විශේෂ රැස්වීම්	23
ජාතික මෙහෙයුම් මැදිරි (NOR) රැස්වීම්	27
ආධාර සපයන්නන්ගේ සමාලෝචන රැස්වීම්	08
ප්‍රගති සමාලෝචන රැස්වීම්	09
ආංශික රැස්වීම්	11
සංවර්ධන පාර්ශවකරුවන් සමඟ රැස්වීම්	23
ව්‍යාපෘති මෙහෙයුම් කමිටු / ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු රැස්වීම්	22
වෙනත් විශේෂ රැස්වීම් / සාකච්ඡා	11
එකතුව	**134**

එසේම, ඇතැම් මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති කාල දිගු ලබා ගනු ලැබුවද අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමට අපොහොසත් වන අවස්ථා පවතින බැවින් උද්ගත වී ඇති ගැටළු නිරාකරණය සම්බන්ධයෙන් උපාය මාර්ගික තීරණ ගැනීමට හා කඩිනමින් ප්‍රතිචාර දැක්වීමට හැකි ස්ථාවර ක්‍රමවේදයක අවශ්‍යතාවයද නිරීක්ෂණය විය. ඒ අනුව, 2022.12.05 දින පැවති අමාත්‍ය මණ්ඩලය රැස්වීමේ දී එලඹී තීරණයකට අනුව ජාතික මෙහෙයුම් මැදිරියක් (NOR) ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපනය කරන ලදී. මේ යටතේ අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුත් ජ්‍යෙෂ්ඨ නිළධාරීන් 11 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් ද ස්ථාපනය කර ඇති අතර ජාතික මෙහෙයුම් මැදිරිය වෙත ඉදිරිපත් කෙරෙන ගැටළු සම්බන්ධයෙන් එම කමිටුව විසින්

කටයුතු කරනු ලැබේ. එමෙන්ම 2022.09.05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී පත් කරන ලද මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණය සහ කඩිනම් කිරීමේ නිළධාරී කමිටුවේ (RAMP) කාර්යභාරයද මෙම ජාතික මෙහෙයුම් මැදිරිය මගින් සිදු කරනු ලැබේ.

2024 වසර තුල ජාතික මෙහෙයුම් මැදිරි රැස්වීම් වාර 27 ක් පවත්වා ඇති අතර ඒමඟින් රේඛීය අමාත්‍යාංශ 17ක් යටතේ ක්‍රියාත්මක වූ විවිධ ව්‍යාපෘතීන් 106 ක අදාල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සමාලෝචනය කරන ලදි. කමිටුවේ මැදිහත්වීම් හා ලබාදුන් තීරණ ක්‍රියාත්මකවීමේ ප්‍රගතිය පහතින් දක්වා ඇත.

වගුව 2.4 : NOR කමිටුවේ මැදිහත්වීම් හා ලබාදුන් තීරණ ක්‍රියාත්මකවීමේ ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දින දක්වා)

ගැටළු වර්ගීකරණය	ව්‍යාපෘති සංඛ්‍යාව
දේශීය/විදේශීය අරමුදල් නිදහස් කිරීම	28
ණය ගිවිසුම්/ ව්‍යාපෘති කාල දිගු ලබා ගැනීම	13
පිරිවැය ඇස්තමේන්තු සංශෝධනය	07
කොන්ත්‍රාත් කළමනාකරණය	09
ව්‍යාපෘති කාර්ය මණ්ඩල	19
ඉඩම් අත්පත් කර ගැනීම	01
පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය	10
ව්‍යාපෘති පිරිවැය ඵලදායීව යෙදවීම	07
ව්‍යාපෘතිවල කාලීන අවශ්‍යතාව අනුව ක්‍රියාකාරකම් ප්‍රමුඛතාගත කිරීම	07
අර්බුදකාරී ආර්ථික වාතාවරණය තුල ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරක්ෂිතව මහජනතාවට ප්‍රතිලාභ ලැබෙන අයුරින් නිම කිරීම	03
වෙනත්	02

පොදු ආයෝජන යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘතිවල ප්‍රමාද සහ ගැටළු අවම කිරීම, මෙන්ම ජනතාවට අපේක්ෂිත ප්‍රතිලාභ කාලෝචිතව ලබාදීම සඳහා, "2024 වසරේ තෙවැනි කාර්තුව අවසානයේදී විශාල පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය" යන මාතෘකාව යටතේ අංක 24/2159/804/02 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් 2024 දෙසැම්බර් 07 වන දින ඉදිරිපත් කරන ලදී.
මේ අනුව, අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා සහ ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමසභාපතිත්වයෙන් හා අදාළ අමාත්‍යාංශ සහ භණ්ඩාගාර දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් " කාර්තුපාදක ඒකාබද්ධ ප්‍රගති සමලෝචන රැස්වීම් " (IPRM) සංවිධානය කිරීමට යෝජනා කරන ලදී.
2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත (PFMA) මඟින් රාජ්‍ය ආයෝජන, රාජ්‍ය - පුද්ගලික හවුල් ව්‍යාපෘති ඇතුළු සියලුම ව්‍යාපෘති නියමිත කාලය තුළ, පොදු ආයෝජන නියමිත කාලය තුළ අනුමත අයවැය ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් භණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීම හා නිම කිරීම කළ යුතු බව නියම කර ඇත. ඒ අනුව, අමාත්‍යාංශ හා ආයතන අතර සම්බන්ධීකරන (inter-ministerial/agency coordination) පහසුකම්

සැලසීම සඳහා " රාජ්‍ය ආයෝජන අධීක්ෂණ හා ඇගයීම් කමිටුව" (PIMEC) කැබිනට් මණ්ඩලය විසින් පත්කරන ලදී. මේ හේතුවෙන්, ජාතික මෙහෙයුම් මැදිරි නිල කමිටුව (NOR), PIMEC මඟින් ප්‍රතිස්ථාපනය කිරීමට නියමිතය.

2.4 සංවර්ධන පාර්ශවකරුවන් වෙත පහසුකම් සැලසීම

ව්‍යාපෘති කඩිනම් කිරීම තුළින් අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල කාලීනව අත්කර ගැනීම තහවුරු කර ගැනීම පිණිස සංවර්ධන පාර්ශවකරුවන් සමඟ වාර්ෂිකව සිදුකරන සමාලෝචන ක්‍රියාවලිය මඟින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මකකරණයේදී සංවර්ධන පාර්ශවකරුවන්ගේ පහසුකම් සලසන්නකුගේ කර්තව්‍යය ද මෙම දෙපාර්තමේන්තුවේ වාර්ෂික වැඩසටහන තුළ ඇති තවත් ප්‍රධාන අංගයක් වේ.

ඒ අනුව, 2024 වර්ෂයේ ආසියානු සංවර්ධන බැංකුව (ADB) හා ලෝක බැංකු (WB) ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති 29 ක ප්‍රගති සමාලෝචනයන් සිදුකරන ලදී. එමඟින් ව්‍යාපෘතිවල පවතින අභියෝගාත්මක ප්‍රශ්න අදාළ බලධාරීන්ගේ අවධානයට යොමු කිරීම මඟින් ඵලදායි ව්‍යාපෘති කළමනාකරණයක් සඳහා දායකවී ඇත.

2.5 ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුව (NEPIF) සැකසීමේ ප්‍රගතිය

ජාතික ඇගයුම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශයන්, ප්‍රමිතීන්, ඇගයීම් ආචාරධර්ම, ආයතනික ව්‍යුහයන්, ඇගයීම් න්‍යාය පත්‍ර, විධික්‍රම උපායමාර්ගික ප්‍රවේශයන් ඇතුලත් කර ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුව භාෂා ත්‍රිත්වයෙන් කෙටුම්පත් කර 2023 සැප්තැම්බර් 08 වැනි දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් නිල වශයෙන් එළිදැක්විණි.

රාජ්‍ය අංශය තුල ව්‍යාපෘති සහ වැඩසටහන් ඇගැයීම් ක්‍රියාවලිය ආයතනගත කිරීම සඳහා ව්‍යාපෘති සැලසුම්කිරීම, අධීක්ෂණයකිරීම සහ මූල්‍ය කළමනාකරණය සම්බන්ධ නිලධාරීන් මෙම ඇගයීම විෂය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබා දිය යුතුය. මේ අවශ්‍යතාවය සපුරාලීම පිණිස, රාජ්‍ය අංශයේ ඇගයීම් ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒමේ ආරම්භක පියවර ලෙස සුදුසුකම් ලත් නිලධාරීන් අතර ඇගයීම් පිළිබඳ දැනුම පුළුල් කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් 2023 වර්ෂයේදී පුහුණුකරුවන් පුහුණු කිරීමේ සහ ඇගැයීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් දිවයිනේ සියළුම පළාත් ආවරණය වන පරිදි පවත්වන ලද කළ අතර, එය 2024 වසරේද ක්‍රියාත්මක විය. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ, රාජ්‍ය අංශයේ ව්‍යාපෘති සහ වැඩසටහන් ඇගැයීම් ක්‍රියාවලි ප්‍රධාන ධාරාවට (mainstream) එකතු කිරීම සඳහා සුදුසුකම්ලත් නිලධාරීන් අතර ඇගැයීම් ක්‍රියාවලි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීමයි.

වගුව 2.5 : ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුව (NEPIF) ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දින දක්වා)	
ක්‍රියාවලි වර්ගීකරණය	**ක්‍රියාවලියන් / අවස්ථා / සහභාගීවුන් ගණන**
ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටු (National Evaluation Steering Committee) රැස්වීම්	01
2025 වසරේදී අදාළ අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මක කිරීමට ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව විසින් අනුමත කළ ඇගයීම් යෝජනා ගණන	10
2025 වසරේදී පළාත් සභා විසින් ක්‍රියාත්මක කිරීමට ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව විසින් අනුමත කළ ඇගයීම් යෝජනා ගණන	04
ජාතික ඇගයීම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ රාමුව (NEPIF) සම්බන්ධ **Trainer of Trainers (TOT)** වැඩසටහන් සංවිධානය කළ සංඛ්‍යාව	02
NEPIF TOT වැඩසටහන් සඳහා සහභාගි වූ නිලධාරීන් ගණන	57
NEPIF පිළිබඳ **සාමාන්‍ය අවබෝධතා වැඩසටහන්** සංවිධානය කළ සංඛ්‍යාව	09
NEPIF සාමාන්‍ය අවබෝධතා වැඩසටහන් සඳහා සහභාගි වූ නිලධාරීන් ගණන	347
නියමු ව්‍යාපෘති ඇගයීම් සංඛ්‍යාව (Pilot Evaluations)	**02**
2024 වසරේදී සිදු කළ ව්‍යාපෘති ඇගයීම් (දක්ෂිණ පළාත් සභාව විසින් ක්‍රියාත්මක කළ පෝෂණ වැඩසටහන) * *නවදුරටත් ක්‍රියාත්මක වේ*	01

2024 වසරේදී, මෙම දෙපාර්තමේන්තුව මඟින් නියමු ව්‍යාපෘති ඇගයීම් (pilot evaluations) 02 ක් සිදු කරන ලදී. "කෑගල්ල දිස්ත්‍රික්කයේ නායයෑමට භාජනයවූ පවුල් සහ ඉහළ අවදානම් ප්‍රදේශවල පදිංචිව සිටින පුද්ගලයන් සඳහා නිවාස ව්‍යාපෘතිය" ඇගයීම් සම්පූර්ණ කිරීම සඳහා ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ සාකච්ඡා Key Informant Interviews (KIIs) 12ක්; රාජ්‍ය නිලධාරීන් සමඟ 10 ක් සහ ප්‍රතිලාභී නොවන කණ්ඩායම් 02ක් සමඟ පවත්වන ලදී. ඉලක්කගත කණ්ඩායම් Focused Group Discussions (FGDs) 04ක් සමඟද සාකච්ඡා පවත්වන ලදී. ප්‍රශ්නාවලි ඉදිරිපත්කර කරනු ලබන සමීක්ෂණ නියැදිය සඳහා අයිතිකරුවන් විසින්ම නිවාස ඉදිකරනු ලබන ප්‍රතිලාභීන් (owner-driven construction approach) 173ක්ද පාලක කණ්ඩායම ලෙස ආධාර සපයන්නන් මඟින් නිවාස ඉදිකර දෙනු ලබන ප්‍රතිලාභීන් (donor-driven construction approach) 35ක්ද තෝරාගන්නා ලදී. ඒ අනුව, ග්‍රාම නිලධාරී වසම් 07ක් පුරා සිටි අයිතිකරුවන් විසින් නිවාස ගොඩනැගූ ප්‍රතිලාභීන් 175ක් සහ ආධාරකරු විසින් නිවාස ගොඩනැගූවන් 43ක් සමඟ ප්‍රශ්නාවලි ඉදිරිපත් කර සමීක්ෂණය (beneficiary survey) සිදු කරන ලදී.

දෙවැනි නියමු ව්‍යාපෘතිය ලෙස "පළාත් පාලන වැඩසටහන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය" ඇගයීම සිදුකරන ලදි. මෙම " ඇගයීම සඳහාද ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ සාකච්ඡා (KIIs) **රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ නිලධාරීන්** සමඟ පැවැත්විනි. **පාර්ශ්වකරුවන් 4 දෙනෙකු** සමඟ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා (FGDs) 04ක් පවත්වන ලදි. ග්‍රාම නිලධාරී වසම් 04ක් ආවරණය වන පරිදි ප්‍රති ලභී ගෘහ ඒකක 272 ක්ද ප්‍රතිලභී ගෘහ ඒකක 54 ක් ද ලෙස ප්‍රශ්නාවලි ඉදිරිපත් කර සමීක්ෂණය (beneficiary survey) සිදු කරන ලදි.

දක්ෂිණ පළාත් සභාවේ ඉල්ලීම මත, "දක්ෂිණ පෝෂණ සුරක්ෂා වැඩසටහන" පිළිබඳ පසු අගැයීම 2024 වසරේදී ආරම්භ කළද, 2024 ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය නිසා සම්පූර්ණ කළ නොහැකි විය. ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ සාකච්ඡා (KIIs) සඳහා දක්ෂිණ පළාත් ප්‍රධාන අමාත්‍යාංශය, ගාල්ල දිස්ත්‍රික් සැලසුම් ලේකම් කාර්යාලය, දක්ෂිණ පළාත් සෞඛ්‍ය, අධ්‍යාපන, ධීවර හා කෘෂිකර්ම අමාත්‍යාංශ, ගාල්ල හා මාතර දිස්ත්‍රික් කාර්යාල ආදී ආයතනවල නිලධාරීන් සහභාගී විය. මීට අමතරව ව්‍යාපෘති කාර්ය සාධනයට බලපෑ පාර්ශ්වකරුවන් සමඟද FGD සාකච්ඡා පවත්වන ලදි. ගාල්ල, මාතර, හා හම්බන්තොට දිස්ත්‍රික්ක 3 ආවරණය කරමින් ප්‍රතිලාභීන් 474 ක් සඳහා ප්‍රශ්නාවලි ඉදිරිපත් කර සමීක්ෂණය (beneficiary survey) සිදු කරන ලදි. ව්‍යාපෘති මූලික සංරචක ලෙස බර අඩු ගර්භණී මවුන් සඳහා වියළි ආහාර මිලදී ගැනීමට වවුචර පත් ලබාදීම / අවුරුදු 5න් පහළ පෝෂණ හිඟ දරුවන් සඳහා වියළි ආහාර මිලදී ගැනීමට වවුචර පත් ලබාදීම / ගෙදර උයන ව්‍යාපෘතිය/ මත්ස්‍ය පැටවුන් ලබාදීම/ ගෙවතු වගා/ වතු ආශ්‍රිත ප්‍රතිලාභීන්ට කුකුළු පැටවුන් ලබාදීම ඇතුලත් විය.

2.6 රේඛීය අමාත්‍යාංශ සඳහා ආයතනික සහ අන්තර් ආයතනික ප්‍රතිඵල රාමු සකස් කිරීම

රාජ්‍ය අංශයේ වැඩසටහන්වල කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ වගවීම වර්ධනය කිරීමටත්/ සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය සහ මූල්‍යාංකනය පද්ධතිමය පදනමක් යටතේ ක්‍රියාත්මක කිරීම ටත්/ දත්ත මත පදනම් වූ තීරණ ගැනීම, සම්පත් වෙන් කිරීම ඉහළ දමා දිගු කාලීන සංවර්ධනය සිදු කිරීමටත් අරමුණු කරගෙන රේඛීය අමාත්‍යාංශයේ ධුරාවලිය සමඟ බැඳී පවතින බවට තහවුරු කෙරෙන පරිදි සංවර්ධන ආයෝජනයන්හි ප්‍රධාන කාර්යසාධක දර්ශක (KPI) ද ඇතුලත් කර අමාත්‍ය මණ්ඩලයේ නියෝගයක් මත පදනම්ව වාර්ෂිකව රේඛීය අමාත්‍යාංශවල කාර්ය සාධනය තක්සේරු කිරීම පිණිස අමාත්‍යාංශ ප්‍රතිඵල රාමු (Organizational Result Frame Work) සැකසීමේ ක්‍රියාවලිය ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශකවරයකුගේද සහාය මත 2024 වසරේදී ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව විශේෂඥ දැනුම සහ උපදේශකයින්ගේ මගපෙන්වීම ඇතිව රේඛීය අමාත්‍යාංශය 25 ක් සඳහා ප්‍රතිඵල රාමු හඳුන්වාදීමේ සැසි පසු ගිය වසරේ පවත්වා ඇත. එම උපදෙස් අනුගමනය කරමින්, වැඩි වියදම් සහිත රේඛීය අමාත්‍යාංශ 10ක් සඳහා ප්‍රතිඵල රාමු සකස් කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලද අතර අනෙකුත් රේඛීය අමාත්‍යාංශවල ප්‍රතිඵල රාමු සැකසීම තවමත් සිදු වෙමින් පවතී.

අමාත්‍ය මණ්ඩලය විසින් පහත අමාත්‍යාංශ 10හි ආයතනික ප්‍රතිඵල රාමු අනුමත කර ඇත.

I. කෘෂිකර්ම සහ වතු කර්මාන්ත අමාත්‍යාංශය
II. අධ්‍යාපන අමාත්‍යාංශය
III. සෞඛ්‍ය අමාත්‍යාංශය
IV. වාරිමාර්ග අමාත්‍යාංශය
V. වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය
VI. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
VII. මහජන ආරක්ෂක අමාත්‍යාංශය
VIII. ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය
IX. නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය
X. ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය

ඉන් අනතුරුව, පහත ආයතනික ප්‍රතිඵල රාමු ක්‍රියාත්මක කිරීමට අදාළ ලේකම්වරයා එකඟ වූ අතර, 2024 වසරේ අවසාන කොටසේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත්, දේශපාලන පද්ධතියේ වෙනස හේතුවෙන් අනුමැතිය ප්‍රමාදවී ඇත. අමාත්‍යාංශ විෂය පථ වෙනස්වීම සමඟ නැවත එම ආයතනික ප්‍රතිඵල රාමු සමාලෝචනය කරමින් පවති.

I. පරිසර අමාත්‍යාංශය
II. ධීවර අමාත්‍යාංශය
III. ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය
IV. අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ පාර්ලිමේන්තු සංශෝධන අමාත්‍යාංශය
V. කම්කරු සහ විදේශීය රැකියා අමාත්‍යාංශය
VI. ජනමාධ්‍ය අමාත්‍යාංශය
VII. තාක්ෂණ අමාත්‍යාංශය
VIII. ක්‍රීඩා සහ තරුණ කටයුතු අමාත්‍යාංශය
IX. වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය
X. වනජීවී සහ වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය
XI. කාන්තා, ළමා සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය

2.7 සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වල ප්‍රගතිය ප්‍රකාශයට පත් කිරීම.

මෙම දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ද සහිතව සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වල කාර්තුමය වශයෙන් කාර්යසාධනය පිළිබඳ ප්‍රගති වාර්තාවන් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. සෑම කාර්තුවක් අවසානයේදීම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත සිය අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘතීන් පිළිබඳ මෙම දෙපාර්තමේන්තුවේ ඇගයීම් හා නිරීක්ෂණ අමාත්‍ය මණ්ඩලය ලබාදුන් තීරණ සමඟින් දැනුම් දීමට කටයුතු කර ඇත.

රාජ්‍ය වියදම් සහ සම්පත් වල කාර්යක්ෂම හා ඵලදායී උපයෝජනය පිළිබඳ තොරතුරු මහජනයාට, සිවිල් සංවිධාන සහ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට පහසුවෙන් ලබාගත හැකිවන පරිදි අදාළ ප්‍රගති වාර්තා ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ (www.treasury.gov.lk) ප්‍රකාශයට පත්කර ඇත.

3 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය


3.1 අයවැය තොරතුරු

2024 වර්ෂය සඳහා අනුමත වූ වියදම් ඇස්තමේන්තුව සහ 2024 වර්ෂය සඳහා වියදම් ප්‍රස්ථාර අංක 01 සහ වගුව අංක 3.1 මඟින් ඉදිරිපත් කෙරේ.


වගුව 3.1 : අයවැය තොරතුරු (2024.12.31 දිනට)
ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් - (රු.මි.)

කාණ්ඩය	ඇස්තමේන්තුගත වියදම	සත්‍ය වියදම
පුනරාවර්තන වියදම්	94.65	81.55
ප්‍රාග්ධන වියදම්	4.4	1.15
මුළු එකතුව	99.05	82.69

ප්‍රස්ථාර අංක 1 : අයවැය තොරතුරු - 2024.12.31 දිනට



3.2 වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය



ඒඑසිඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	තක්ෂ 2024 රු.	2023 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒඑසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		79,210,000	78,148,000	ඒඑසිඒ-3
-	නැන්පතු		747,676	726,446	ඒඑසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		6,162,797	4,656,280	ඒඑසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**86,120,473**	83,530,726	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**86,120,473**	83,530,726	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**744,622**	844,974	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**85,375,851**	82,685,753	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
68,000,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	61,935,795	61,372,632	
26,250,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	19,353,061	20,403,968	ඒඑසිඒ-2(ii)
400,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	259,350	327,070	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
94,650,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**81,548,206**	82,103,670	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	
2,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	212,400	-	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒඑසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
400,000	භෑකියා වර්ධනය	14	210,170	-	
2,000,000	වෙනත් මූලධන වියදම්	15	728,202	-	
4,400,000	**මුළු මූලධන වියදම් (උ)**		**1,150,772**	-	
	නැන්පතු ගෙවීම්		747,676	726,446	ඒඑසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		6,036,373	4,005,214	ඒඑසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**6,784,049**	**4,731,659**	
99,050,000	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		89,483,027	86,835,329	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(4,107,176)	(4,149,577)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(4,107,176)	(4,149,577)	ඒඑසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒඑසිඒ-3
			(4,107,176)	(4,149,577)	

1

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2024 රු.	2023 රු.
		කත්‍ය	
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	64,756,889	64,604,642
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	8,501,759	8,628,183
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**73,258,647**	**73,232,825**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		8,501,759	8,628,183
දේපළ පිරියත හා උපකරණ සංචිතය		64,756,889	64,604,642
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4		
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		-	-
		73,258,647	**73,232,825**

පිටු අංක 1 සිට 24 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 25 සිට 32 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර : වි.ගු.ල.ප.	තනතුර :	නම :
දිනය : කේ.එම්.මහින්ද සිරිවර්ධන	දිනය : 19/02/25	දිනය : 19/02/2025
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්	එස්.එස්. මුදලිගේ අධ්‍යක්ෂ ජනරාල් ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය	අධ්‍යක්ෂ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය
මුදල් අමාත්‍යාංශය		
කොළඹ 01.		කොළඹ 01


3.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	කණ්ඩායම	
	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල් බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	3,512,135	3,476,158
අග්‍රිම ලැබීම්	79,210,000	78,148,000
අත්තිකාරම් අයකර ගැනීම්	4,229,468	3,864,229
තැන්පතු ලැබීම්	747,676	726,446
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**87,699,279**	**86,214,833**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	81,031,006	81,503,100
සහනාධාර සහ මාරුකිරීම්	259,350	327,070
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	744,622	844,974
අත්තිකාරම් ගෙවීම්	3,978,254	2,813,244
තැන්පතු ගෙවීම්	747,676	726,446
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**86,760,907**	**86,214,833**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**938,372**	**0**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	938,372	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**938,372**	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(938,372)**	-
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	**0**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්



ර්තාකිරීමේ පදනම

වාර්තාකරණ කාලපරිච්ඡේදය

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

ආදායම් හඳුනාගැනීම

භුවමාරු හා භුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන ක්‍රියාපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

6

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

මෙම දෙපාර්තමේන්තුව ආදායම් එකතු කිරීමේ දෙපාර්තමේන්තුවක් නොවේ.

වගු අංක 3.2 : ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. '000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
මෙම දෙපාර්තමේන්තුව ආදායම් එකතු කිරීමේ දෙපාර්තමේන්තුවක් නොවේ.					

3.7 ප්‍රතිපාදන උපයෝජන කිරීමේ කාර්ය සාධනය

වගු අංක 3.3 : ප්‍රතිපාදන උපයෝජන කිරීමේ කාර්ය සාධනය

රු. '000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝජනය, අවසාන ප්‍රතිපාදනයෙහි % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	94,650,000	94,650,000	81,548,206	86.15
ප්‍රාග්ධන	4,400,000	4,400,000	1,150,772	26.15

3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

වගු අංක 3.4 : වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. '000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝජන කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	-	-	-	-	-	-

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වගු අංක 3.5 : මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. '000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2024 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	
9152	යන්ත්‍රෝපකරණ	64,756,888.79	64,756,888.79	-	100%
9153	ඉඩම්	-	-	-	
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

** ** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට ඇති අතර එහි මුද්‍රිත පිටපත ඇමුණුම 02 වශයෙන් මෙහි අන්තර් ගත කර ඇත.

4 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශකය

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

වගුව 4.1 : ආයතනයේ කාර්යසාධන දර්ශක (2024.12.31 දිනට)			
විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම්		
	100%- 90%	75% -89%	50%-77%
ප්‍රගති සමාලෝචනය සිදුකරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘති සංඛ්‍යාව	√		
තීරණ ගැනීම පිණිස කාලීනව නිකුත් කරන ලද ප්‍රගති සමාලෝචන වාර්තා සංඛ්‍යාව		√	
ගැටළු නිරාකරණය කිරීම සඳහා විදේශීය මූල්‍යනය සපයන ආයතන සමග පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව			√
නිරතවූ ක්ෂේත්‍ර චාරිකා සහ හඳුනාගත් ගැටළු සංඛ්‍යාව			√
ජාතික ඇගයීමේ ප්‍රතිපත්ති රාමුව සැකසීමේ මට්ටම/තත්වය	√		
තෝරාගත් ව්‍යාපෘතියක් ඇගයීමේ ක්‍රියාවලියේ නිරතවීමේ මට්ටම/තත්වය	තෝරාගත් ව්‍යාපෘති 02 ක් 2024 වර්ෂයේ ඇගයීම් කරන ලද අතර එහිදී නිරීක්ෂණය වූ කරුණු සම්බන්ධයෙන් අදාල පාර්ශව කැඳවා දැනුවත් කිරීම් කරන ලදි.		
කාර්ය මණ්ඩල හැකියාව සහ නිපුණතාව වර්ධනය කිරීම සඳහා යොමු කෙරුණු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	√		

5 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

තිරසාර සංවර්ධන අරමුණ ළඟා කර ගැනීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් හා වැඩසටහන්වල අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමේ ප්‍රගතීන් අධීක්ෂණය හා ඇගයීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් කළ යුතු කාර්යභාරය වගු අංක 5.1 හි දක්වා ඇත.

වගු අංක: 5.1 : තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය					
ඉලක්කය/ අරමුණ	**ඉලක්ක**	**ජයග්‍රහණ දර්ශක**	**මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය**		
			0% - 49%	**50%- 74%**	**75%- 100 %**
16	16.6 16.7 16.8 16.10	1. වෙබ් පාදක ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය සඳහා ප්‍රවේශ වූ පාර්ශවකරුවන් ගණන	ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය සැකසුම් මට්ටමේ පවතී.		
		2. වෙබ් පාදක ජාතික සංවර්ධන තොරතුරු පද්ධති ප්‍රවේශයට සිදු වූ අවහිරතා පිළිබඳ වාර්තාවීම්			
		3. ඇගයීම් අනාවරණයන් සඳහා පහසු ප්‍රවේශය		√	
		4. වෙබ් පාදක ජාතික සංවර්ධන තොරතුරු පද්ධතියට නියමිත අවස්ථාවේදී ප්‍රවේශයවීමට සිදු වූ අවහිරතා පිළිබඳ වාර්තාවීම්	තොරතුරු පද්ධතිය සැකසුම් මට්ටමේ පවතී.		
		5. සංවර්ධන පාර්ශවකරුවන් සමඟ පැවැත්වූ ඒකාබද්ධ ව්‍යාපෘති සමාලෝචන සංඛ්‍යාව		√	
		6. සංවර්ධන පාර්ශවකරුවන් සතු තොරතුරු සඳහා ප්‍රවේශය		√	
17	17.8 17.16 17.17	1.සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් හුවමාරු වූ දත්ත පවත්වා ගැනීම			√
		2. හොඳම භාවිතයන් (ව්‍යාපෘති) පිළිබඳ තොරතුරු පවත්වාගෙන යාම			√

6 පරිච්ඡේදය- මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

2024.12.31 දිනට දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදි විය.

වගුව 6.1 : කාර්යමණ්ඩල තොරතුරු (2024.12.31 දිනට)

කාර්ය මණ්ඩල වර්ගීකරණය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ ශ්‍රේණියේ නිලධාරීන්	31	21	10
තෘතීය මට්ටමේ නිලධාරීන්	04	01	03
ද්විතීය මට්ටමේ නිලධාරීන්	46	33	13
ප්‍රාථමික මට්ටමේ නිලධාරීන්	20	13	07
එකතුව	**101**	**68**	**33**

6.2 කාර්ය මණ්ඩල පුරප්පාඩු

දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 101 කින් සමන්විත විය යුතු වුවද, 2024.12.31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය නිලධාරීන් 68 කින් පමණක් සමන්විත විය. ඒ අනුව පැවති පුරප්පාඩු සංඛ්‍යාව 33 කි. පුරප්පාඩු වී ඇති ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දසදෙනෙකු අතුරින් පස්දෙනෙකු ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට අයත් වන අතර, ඒ අතුරින් තනතුරු දෙකක් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කාණ්ඩයටත් තවත් තනතුරු දෙකක් අධ්‍යක්ෂ කාණ්ඩයටත් ඉතිරි තනතුර නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ කාණ්ඩයට ද අයත්වේ. එමෙන්ම, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ තනතුරු 02 ක් සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරු 03ක් පුරප්පාඩු වී පැවතීමද ඇතුළුව, අනෙකුත් සේවා වල පැවති පුරප්පාඩු දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට වඩාත් හොඳින් පවත්වාගෙන යාමට ඍණාත්මකව බලපා ඇත.

දෙපාර්තමේන්තුවෙහි ද්විතියික සේවක කාණ්ඩය යටතට ගැනෙන සංවර්ධන නිලධාරීන්ද, 2022/06/22 දිනැති 14/2022 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව නිවාඩු ලබා මෙරට හෝ පිටරට සේවය කිරීම පිණිස අවස්ථාව ලබා ගැනීම නිසා තත්‍ය කාර්ය මණ්ඩලය අඩුවීමද දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට බලපා ඇත.

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ ජ්‍යෙෂ්ඨ ශ්‍රේණියේ නිලධාරීන් හැරුණු කොට අනෙකුත් සේවාවන්හි ජ්‍යෙෂ්ඨ ශ්‍රේණියේ නිලධාරීන්ද මෙම දෙපාර්තමේන්තුවෙහි ව්‍යාපෘති කළමනාකරණය සහ අධීක්ෂණ කාර්යයන්හි නිරත වීමේ අවස්ථාව ලැබී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වගුව 6.2: සේවක පුහුණු විස්තර (2024.12.31 දිනට)

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව (දින)	සමස්ත ආයෝජනය(රු.මී)		වැඩසටහනනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම්/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
GoSL Joint Collaboration with center for Good Governance (NCGG), India – Sri Lanka	01	06	අනුග්‍රාහක ආයතනය විසින් දරා ඇත.		විදේශීය	ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශ්වික සබඳතා වර්ධනය කිරීම/යහපාලන පිළිවෙත්
Capacity Building Program on Project Readiness and Related Issues - India	02	03	අනුග්‍රාහක ආයතනය විසින් දරා ඇත.		විදේශීය	ව්‍යාපෘති සූදානම සහ අදාළ ගැටළු
Seminar on Barrier Free Access for Senior - Level Professionals under the Belt and Road Initiative	01	13	අනුග්‍රාහක ආයතනය විසින් දරා ඇත.		විදේශීය	බාධක රහිත ප්‍රවේශය පිළිබඳ දැනුම
Development though Rural and Climate Finance	01	11	අනුග්‍රාහක ආයතනය විසින් දරා ඇත.		විදේශීය	ග්‍රාමීය හා දේශගුණික මූල්‍ය හරහා සංවර්ධනය පිළිබඳ දැනුම
0529-0611 Seminar on Medium to Long Term Development Planning Countries	01	13	අනුග්‍රාහක ආයතනය විසින් දරා ඇත.		විදේශීය	මධ්‍ය කාලීන සිට දිගු කාලීන සංවර්ධන සැලසුම්කරණය
Seminar on Production Capacity of Agriculture for Developing Countries	01	13	අනුග්‍රාහක ආයතනය විසින් දරා ඇත.		විදේශීය	කෘෂිකර්මාන්තයේ නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම පිළිබඳ දැනුම

Frist Mid Carrier Training Programme for Island Services Officers of Sri Lanka under the Indian Technical & Economic co - operation (ITEC) 2024 / 2025	01	11	අනුග්‍රාහක ආයතනය විසින් දරා ඇත.	විදේශීය	දීපව්‍යාප්ත සේවාවන්හි මැද පෙළ කළමනාකරුවන් සඳහා වාහක සංවර්ධන මාර්ගෝපදේශයන්
Seminar on Ecotourism Development and Management for Sri Lanka	01	13	අනුග්‍රාහක ආයතනය විසින් දරා ඇත.	විදේශීය	පරිසර සංචාරක සංවර්ධනය සහ කළමනාකරණය සඳහා ධාරිතාව වැඩි දියුණු කිරීම
International Training Programme on Monitoring and Evaluation of Development Project/Programme - Women Only	01	13	අනුග්‍රාහක ආයතනය විසින් දරා ඇත.	විදේශීය	සංවර්ධන ව්‍යාපෘති / වැඩසටහන් අධීක්ෂණය සහ ඇගයීම පිළිබඳ ධාරිතා සංවර්ධනය
2024 Asian Evaluation Week	01	03	අනුග්‍රාහක ආයතනය විසින් දරා ඇත.	විදේශීය	ඇගයීම් පිළිවෙත් පිළිබඳ දැනුම බෙදා ගැනීම සහ ලබා ගැනීම
ADB: South Asia Portfolio Forum 2024	01	02	අනුග්‍රාහක ආයතනය විසින් දරා ඇත.	විදේශීය	කළඹ සමාලෝචන වලදී දැනුම සහ තීක්ෂණ බුද්ධිය බෙදා ගැනීම
ITEC : Managing Infrastructure Development Risk Lessons from Asia Pacific Region	01	13	අනුග්‍රාහක ආයතනය විසින් දරා ඇත.	විදේශීය	යටිතල පහසුකම් සංවර්ධන අවදානම් පාඩම් කළමනාකරණය

150 days training programme conducted by Languages Department on Tamil and Sinhala Language	15	50	රාජ්‍ය භාෂා දෙපාර්තුමේන්තුව විසින් වියදම් දරා ඇත.	දේශීය	රාජ්‍ය නිලධාරීන්ගේ දෙමළ සහ සිංහල භාෂා ප්‍රවීනතාවය වැඩිදියුණු කිරීම
Training on discipline and general conduct for drivers and OESs	04	02	52,000.00	දේශීය	රියදුරන් සඳහා ආරක්ෂිතව, විද්‍යාත්මකව සහ කාර්යක්ෂම රිය ධාවනය සඳහා වූ දැනුම කාර්යාල සේවක සේවයේ සේවකයන් සඳහා ඇති වගකීම් හා සාමාන්‍ය හැසිරීම පිළිබඳ දැනුම
Training for drivers on scientific and efficient way of driving	01	01	6,000.00	දේශීය	විද්‍යාත්මක හා කාර්යක්ෂම රිය පැදවීම පිළිබඳ දැනුම
Stores Management and Purchasing Procedures	02	02	26,000.00	දේශීය	ප්‍රසම්පාදන සහ ගබඩා කළමනාකරණය
වැටුප් පරිවර්තනය	02	03	39,000.00	දේශීය	වැටුප් පරිවර්තනය පිළිබඳ දැනුම

7 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

වගුව 7.1 : අනුකූලතා වාර්තාව (2024.12.31 දිනට)

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍යප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්			
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වා ගෙනයාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ . 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවත් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2001 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	**අනුකූල වේ**		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	**අනුකූල වේ**		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේ න්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			

5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	**අනුකූල වේ**		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	**අනුකූල වේ**		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තා වකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	**අනුකූල වේ**		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	**අනුකූල වේ**		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර් තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	**අනුකූල වේ**		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් පවත්වනු ලැබේ.	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කලමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව , වත්කම් මිල දී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව , එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා	අනුකූල වේ		


	පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු. රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට නැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම		විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුම් ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසැඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව,රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ.		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම			
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම			
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	**අනුකූල වේ**		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	**අනුකූල වේ**		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	**අනුකූල වේ**		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වා ගෙන යාම	**අනුකූල වේ**		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	**අනුකූල වේ**		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	**අනුකූල වේ**		

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (I) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	**අනුකූල වේ**		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි , පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධික්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	**අනුකූල වේ**		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	**අනුකූල වේ**		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම , නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	**අනුකූල වේ**		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව - සංවිධාන ව්‍යුහය 2024.12.31



ඇමුණුම II

(15)

(16)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. TPD/B/DPMM/24//FA

ඔබේ අංකය
உமது இல.
Your No.

RECEIVED
04 JUN 2025

දිනය
திகதி
Date 2025 මැයි 31 දින

ගණන්දීමේ නිලධාරී

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යටෝක්ත වාර්තාව සහ විගණිත මූල්‍ය ප්‍රකාශන මේ සමග එවමි.

ඩී.ජී.ඒ.එස්. අනුලසිරි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත : (1) අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - මූල්‍ය ප්‍රකාශනවල මුල් පිටපත හා උක්ත වාර්තාවේ පිටපතක් මේ සමඟ එවා ඇත.

(2) ලේකම් - මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය (කා.දැ.ස)

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(15)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(16)

මගේ අංකය
எனது இல.
My No. TPD/B/DPMM/24//FA

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2025 මැයි 31 දින

RECEIVED
04 JUN 2025

D/Finance
Pl. speak
m
25/06/04

ගණන්දීමේ නිලධාරී
ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශවලින්, මූල්‍ය තත්ත්වය,මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා

වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.1 ඡේදය ප්‍රකාරව නව CIGAS වෙබ් යෙදුම් පද්ධතියෙන් ලබාගත් අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන මූල්‍ය ප්‍රකාශනයට අමුණා තිබිය යුතු වුවත් SA-10, SA-11, SA-12,SA-30,SA-50,SA-51,SA-70,SA-80 සහ SA-90 යන මුද්‍රිත ඊට අමුණා නොතිබුණි.

1.6.2 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

(අ) භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA-52ට අනුව 2024 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ අත්තිකාරම් ලැබීම් රු.6,313,544ක් වුවද එය රු.6,162,797ක් ලෙසත්, අත්තිකාරම් ගෙවීම් රු.6,187,120ක් වුවද එය රු.6,036,373ක් ලෙසත් දක්වා තිබීම හේතුවෙන් එම අගයන් රු.150,747ක් බැගින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මූලධන වියදම් යටතේ වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් යටතේ දැක්විය යුතු රු.212,400 ක වියදම මූලධන අත්පත් කර ගැනීම් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දක්වා තිබුණි.

1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 6 ඡේදයට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මුදල් සහ හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගෙන සෘජු ක්‍රමය භාවිතා කරමින් පිළියෙල කලයුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් මුදලින් ලද අත්තිකාරම් ලැබීම් සහ මුදලින් කල අත්තිකාරම් ගෙවීම් පමණක් සැලකිල්ලට ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර තිබුණි. ඒ අනුව අත්තිකාරම් ලැබීම් හා අත්තිකාරම් ගෙවීම් රු.2,271,629 ක් බැගින් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය හා මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.4 මූල්‍ය නොවන වත්කම්

මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය (භාණ්ඩාගාර මුද්‍රිත සටහන SA-82) පිළිබඳව පහත නිරීක්ෂණයන් සිදුකෙරේ.

(අ) පසුගිය වසරේ විගණිත මූල්‍ය ප්‍රකාශ අනුව එම වර්ෂය අවසානයේ මූල්‍ය නොවන වත්කම්වල අගය රු.64,604,642 ක් ලෙස දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේ ඊට අනුරූපී ආරම්භක ශේෂයක් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබූ එකතුව රු.27,411 ක් වූ වත්කම් සහ වෙනත් ආයතන විසින් දෙපාර්තමේන්තුව වෙත භාර දී තිබූ එකතුව රු.582,017 ක් වූ වත්කම්, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ මිලදී ගැනීම් සහ පවරාදීම් (Transfer in) ලෙස දක්වනු වෙනුවට ඉහත වත්කම්වල එකතුව වූ රු.609,428 ආරම්භක ශේෂයට එකතුකල වටිනාකම් ලෙස දක්වා තිබුණි.

(ඇ) කාලච්ඡේදය තුළ දෙපාර්තමේන්තුව විසින් පවරාගත් හා පවරාදෙනු ලැබූ එක් එක් අයිතමවල වටිනාකම් වත්කම් පවරා ගැනීම පත්‍රිකාවල විධිමත් ආකාරයට වාර්තකර නොතිබුණි. ඒ අනුව පවරාගත් අයිතම 09 න් අයිතම 07 ක සහ පවරා දුන් අයිතම 8කින් 07 ක වටිනාකම් පවරාදීම් පත්‍රිකාවල සඳහන් කර නොතිබුණි.

1.6.5 ACA-5 ආකෘතිය

මූල්‍ය ප්‍රකාශය සමඟ ඉදිරිපත් කර තිබූ අත්තිකාරම් බී ගිණුම පිළිබඳ ප්‍රකාශය (ACA-5 ආකෘතිය) භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA-52 හි සඳහන් වටිනාකම් සමඟ සැසඳීමේදී රු.150,747 වෙනසක් නිරීක්ෂණය වුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

විගණන නිරීක්ෂණ	මෙම වාර්තාවේ ඡේදයට යොමුව
ඉකුත් වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල අගය රු.64,604,642 ක් වූවත් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ශූන්‍ය අගයක් ලෙස දක්වා තිබුණි.	1.6.4

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 අග්‍රිම කළමනාකරණය

දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කළ කාර්යයන් ඉටු කිරීම සඳහා 2024 වර්ෂයේදී එකතුව රු.මිලියන 100.69ක් අග්‍රිම භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර තිබුණ ද, භාණ්ඩාගාරය විසින් එකතුව රු.මිලියන 79.15ක් පමණක් ලබා දී තිබුණි. ඒ අනුව ඉල්ලුම් කළ අග්‍රිමයට වඩා එකතුව රු.මිලියන 21.54 ක් හෙවත් සියයට 21 ක් අඩුවෙන් ලැබී තිබුණු බව නිරීක්ෂණය විය.

3.2 වියදම් කළමනාකරණය

(අ) වැය විෂයයන් 4 සම්බන්ධයෙන් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් එකතුව වූ රු.5,500,000 කින් රු.3,984,978 ක් උපයෝජනය කිරීමකින් තොරව ඉතිරි වී පැවතුණි. එය එම වැය විෂයයන්ගේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 57ත් සියයට 89ත් අතර පරාසයක පැවතුනි.

(ආ) එක් වැය විෂයයකට අදාලව රු.2,000,000ත් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයයන් සඳහා මාරු කළ පසුද රු.1,830,000 ඉතිරි වී තිබුණි. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 100 ක් විය.

(ඇ) ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමෙන් තොරව මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.450,000 ට අමතරව රු.100,000 මු.රෙ. 66 මඟින් ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි. එම මාරු කර ගත් මුළු ප්‍රතිපාදනයම එනම් 100%ක් උපයෝජනය නොකර ඉතිරිව පැවතුණි.

3.3 2024 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

(අ) වැය විෂයයන් 02කට අදාලව බැරකම් ප්‍රකාශනයේ එකතුව රු. 80,000 ක් වුවද බැරකම් ලේඛනයේ හා වවුවර පරීක්ෂාව අනුව එය එකතුව රු.73,818ක් වී තිබූ අතර ඒ අනුව රු.6,182ක වෙනසක් නිරීක්ෂණය වුණි.

(ආ) වැය විෂයයන් 03කට අදාලව බැරකම් ප්‍රකාශයට අනුව බැඳීම් සහ බැරකම් එකතුව රු. 467,000ක් වුවද වවුවර්පත් පරීක්ෂාව අනුව එය එකතුව රු.535,208ක් වී තිබූ අතර ඒ අනුව රු.79,218ක ශුද්ධ වෙනසක් නිරීක්ෂණය වුණි.

3.4 ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස පවත්වාගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව

සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු බවට නියමකර තිබුණද, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.5 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති ප්‍රකාරව සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු වසර 9 ක් පැරණි රු.139,921 ක් වූ ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් වී නොතිබුණි.

3.6 තත්කාර්ය අතුරු අග්‍රිම

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරින්ට පමණක් එක් අවස්ථාවකදි ලබා දෙන රු.100,000 ක උපරිමයක් තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබා දීමට ගනන්දීමේ නිලධාරියෙකුට හැකිය. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් දක්ෂිණ පෝෂණ සුරක්ෂණ වැඩසටහන ඇහයීම සඳහා මාතර දිස්ත්‍රික්කයෙන් වැඩ සටහන් 3 ක් හා ගාල්ල දිස්ත්‍රික්කයෙන් එක් වැඩ සටහනක ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතු වෙනුවෙන් එකතුව රු.985,876 අත්තිකාරම් මුදල් ලෙස ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) අත්තිකාරම් අවශ්‍ය ප්‍රමාණය පිළිබඳව විධිමත් ඇගයීමකින් තොරව උපරිම සීමාව එක් එක් වැඩසටහන් වෙනුවෙන් රු.225,000 ට වැඩියෙන් අත්තිකාරම් ලබාදී තිබූ අතර, එක් එක් වැඩසටහන් වෙනුවෙන් වියදම් නොවී ඉතිරි වූ මුදල ලෙස රු.100,000 ට වැඩියෙන් හෙවත් ලබා ගත් අත්තිකාරම් මුදලින් සියයට 53 ත් සියයට 60 ත් අතර පරාසයක් නැවත මුදලින් පියවා තිබුණි. විගණන දිනය වූ 2025 මැයි 05 දින වන විට ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතු නිම කර මාස 04 ක් ඉක්මවා තිබුණ ද ඒ සම්බන්ධයෙන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තුව විසින් අත්තිකාරම් පිළිබඳ වාර්තා විධිමත් ආකාරයට යාවත්කාලීනව පවත්වාගෙන් නොතිබූ අතර අත්තිකාරම් ලේඛනයේ අත්තිකාරම් ලබාදීමට අදාළව

වවුවර් අංකය හා පියවිම් වවුවර්පත් අංකය සඳහන් නොකිරීම, අත්තිකාරම් ලබා දුන් නිලධාරියාගේ තනතුර සඳහන් නොකිරීම, අත්තිකාරම් ගෙවීම් නිවැරදිව සටහන් නොකිරීම ආදී අවධිමත් තත්ත්වයන් නිරීක්ෂණය වුණි. තවද, උක්ත වැඩ සටහන් සඳහා ලබාදී තිබූ අත්තිකාරම් 2024 නොවැම්බර් හා දෙසැම්බර් මාසවල සිදුකර තිබුණද අත්තිකාරම් ලේඛනයේ ඒවා අගෝස්තු මාසයේ ගෙවූ බවට සඳහන් කර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණනයට ඉදිරිපත් කල වුවත් විගණනයට ඉදිරිපත් කිරීමට දින 30 ක කාලයක් ප්‍රමාද වී තිබුණි.

4.1.2 ක්‍රියාකාරී සැලැස්ම

දෙපාර්තමේන්තුව විසින් 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් මාර්ගෝපදේශයේ දැක්වෙන ආකෘතිය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. දෙපාර්තමේන්තුව විසින් සකස් කර තිබූ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙහි හා ප්‍රගති වාර්තාවේ දත්තවල නිරූපණය කිරීමේ පරස්පරතාවයන් නිරීක්ෂණය වූ අතර 2024 වර්ෂයේ ක්‍රියාකාරකම්වල අපේක්ෂිත භෞතික ඉලක්ක හා ළඟාකර ගත් ඉලක්කය සංඛ්‍යාත්මව නිරූපණය වන ආකරයට එහි ප්‍රගති වාර්තාව සකස්කර නොතිබුණි.

4.1.3 කාර්යභාරයන් ඉටු කිරීම

(අ) සමාලෝචිත වර්ෂයේ විවිධ රේඛීය අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වූ විශාල සහ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති 226 ක් ව පැවති අතර, ඒ අතරින් ව්‍යාපෘති 120 ක් දේශීය අරමුදල් හා ණය මඟින් ද, ව්‍යාපෘති 106 ක් විදේශීය ණය හා ප්‍රදාන මඟින් ද මූල්‍යනය කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේදී නිම කිරීමට නියමිතව තිබූ ව්‍යාපෘති 110 ක් අතරින් ව්‍යාපෘති 23 ක් පමණක් අවසන් කර තිබූ අතර, වර්ෂ අවසානය වන විට කාර්යසාධන ගැටළු හේතුවෙන් ව්‍යාපෘති 02 ක් අත්හිටුවා තිබුණු අතර ව්‍යාපෘති 85 ක්

අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වී තිබුණි. එසේම, 2024 වර්ෂයදී මෙම ව්‍යාපෘති සඳහා දළ වශයෙන් රු.බිලියන 705 ක් ප්‍රතිපාදනය වෙන්කර තිබුණද, වර්ෂය අවසාන වන විට රු. බිලියන 402 ක් පමණක් හෙවත් ප්‍රතිපාදනයෙන් සියයට 57 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය ඉහළ නැංවීම සඳහා වූ දෙපාර්තමේන්තුවේ අරමුණ අපේක්ෂිත පරිදි ඉටුකරගත හැකිවන ලෙස එම කටයුතු මෙහෙයවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව අනුව වර්ෂය තුළ ව්‍යාපෘති ක්ෂේත්‍ර චාරිකා පරීක්ෂණ 79 ක් ඉලක්කකර තිබුණද, ව්‍යාපෘති 41 ක් පමණක් ආවරණය කර තිබුණි.

4.1.4 ප්‍රසම්පාදනය

(අ) ප්‍රසම්පාදන සැලසුම්කිරීම

(i) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කොට ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගත යුතු වූවත් 2024 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම නියමිත කාලය තුළ සකස්කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද, පිළියෙලකරන ලද සැලස්මට අදාල ප්‍රගතිය විගණනය වෙත වාර්තාකර නොතිබුණි.

(ii) මෘදුකාංග සංවර්ධනයට රු.2,000,000 ක් හා මෘදුකාංග නඩත්තුව සඳහා රු.2,000,000 ක් ලෙස එකතුව රු.4,000,000 ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ලෙස වෙන්කර තිබුණද එය සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන සැලසුමට ඇතුලත් කර නොතිබුණි.

(iii) මෘදුකාංග සංවර්ධනය සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 89 ක් හා මෘදුකාංග නඩත්තුව සඳහා ඇස්තමේන්තුගත මුළු ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි වී පැවතුණි.

(ආ) රාජ්‍ය ආයතන වෙත රාජ්‍ය විදයුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වා දීම පිළිබඳව වූ 2018 ඔක්තෝබර් 23 දිනැති අංක 05/2018 හා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ප්‍රසම්පාදන අස්ථිත්ව ලියාපදිංචිය, සම්බන්ධීකරණ නිලධාරීන් ලියාපදිංචිය, සැපයුම්කරුවන් ලියාපදිංචිය, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

ඉදිරිපත් කිරීම, ප්‍රසම්පාදන දැන්වීම් ප්‍රසිද්ධ කිරීම, මිල සැඳහුම් ක්‍රමයට විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීම ආදී කටයුතු සියලු රාජ්‍ය ආයතන විසින් සිදු කළ යුතු බව දක්වා තිබුණද, ඊට පටහැනිව, සමාලෝචිත වර්ෂය තුලදී රු.1,449,546 ක් වටිනා ටයර් සහ බැටරි මිල සැඳහුම් ක්‍රමයට සපයාගෙන තිබුණි.

4.2 අනාර්ථික ගනුදෙනු

දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වන ව්‍යාපෘති ප්‍රගති අධීක්ෂණය හා කළමණාකරණ සඳහා අත්‍යවශ්‍ය දත්ත රැස්කිරීමේ හා ඇගයීමේ ප්‍රධාන මාධ්‍යක් ලෙසට භාවිතා කිරීම සඳහා ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය (NDIS) සහ නව තාක්ෂණය යොදා ගනිමින් වෙබ් පදනම් කර ගත් ව්‍යාපෘති අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා, 2021 වර්ෂයේදී විවෘත මිල කැඳවා බඳු සහිත රු.135,720,000 ක කොන්ත්‍රාත් වටිනාකමකට E.W. Information Systems සමාගමට වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. එසේ වුවද, විගණිත දිනය වනවිටත්, අදාල තොරතුරු පද්ධතිය නවීකරණය කර ගැනීමට අපොහොසත්වී තිබුණි. ඒ අනුව, ව්‍යාපෘති කළමණාකරණයේදී ඒවා සමාලෝචනය, වාර්තා කිරීම, සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කිරීම වැනි අවස්ථාවලදී මතුවන ගැටළු නිරාකරණය හා සම්බන්ධීකරණය අවම කාර්ක්ෂමතාවයකින් යුතුව ක්‍රියාත්මක වන බවට නිරීක්ෂණය කෙරේ.

4.3 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් හා වැඩසටහන්වල අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමේ ප්‍රගතීන් අධීක්ෂණය හා ඇගයීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබූ කාර්යභාරයන්හි ප්‍රගතිය පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වෙබ් පාදක ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින බැවින් දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබූ පහත සඳහන් තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ දර්ශක 03 ක් සම්බන්ධව කිසිදු ප්‍රගතියක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(i) වෙබ් පාදක ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය සඳහා ප්‍රවේශ වූ පාර්ශවකරුවන් ගණන

(ii) වෙබ් පාදක ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය ප්‍රවේශයට සිදුවූ අවහිරතා පිළිබඳ වාර්තා වීම්

(iii) වෙබ් පාදක ජාතික සංවර්ධන තොරතුරු පද්ධතියට නියමිත අවස්ථාවේදී ප්‍රවේශ වීමට සිදුවූ අවහිරතා පිළිබඳ වාර්තාවීම්

(ආ) දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු හා පහසුකම් සැලසිය යුතු පහත සඳහන් තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ දර්ශක 03 හි අරමුණු ළඟා වීම සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(i) ඇගයීම් අනාවරණයන් සඳහා පහසු ප්‍රවේශය

(ii) සංවර්ධන පාර්ශවකරුවන් සමඟ පැවැත්වූ ඒකාබද්ධ ව්‍යාපෘති සමාලෝචන සංඛ්‍යාව

(iii) සංවර්ධන පාර්ශවකරුවන් සතු තොරතුරු සඳහා ප්‍රවේශය

5. මානව සම්පත් කළමනාකරණය

(අ) දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 101 න් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි සෘජු බලපෑමක් සහිත ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 10 ක්ද ඇතුළුව තනතුරු 34 ක් හෙවත් සියයට 34 ක පුරප්පාඩු පැවතිණි. එසේ වුවද, අදාල පුරප්පාඩු තනතුර පුරවා ගැනීමට හෝ අවශ්‍යතාවයට අනුව, අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීමට දෙපාර්තමේන්තුව විධිමත් පියවර ගෙන නොතිබුණි.

ආ) 2024 දෙසැම්බර් 31 දිනට විගණනය සඳහා ඉදිරිපත් කල තොරතුරුවලට අනුව ද්විතික මට්ටමේ තත්‍ය සේවක සංඛ්‍යාව 32 ක් සහ පුරප්පාඩු සේවක සංඛ්‍යාව14 ක් ලෙස දක්වා තිබුණද කාර්ය සාධන වාර්තා අනුව තත්‍ය සේවත සංඛ්‍යාව 33 ක් සහ පුරප්පාඩු සේවක සංඛ්‍යාව 13 ක් ලෙස දක්වා තිබුණි.

ඩී.ජී.ඒ.එස්. අනුලසිරි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට